# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/51 - 2021 අගෝස්තු මස 06 වැනි සිකුරාදා - 2021.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 19/78 (V)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

13 වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය, මොහොමඩ් අලි සබ්රි වන මා විසින්, මේ නියමය මගින් -

(අ) හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ දේශ සීමාව සහ එහි දේශීය ජල තීරය ; සහ

(ආ) 2017 සැප්තැම්බර් මස 25 වැනි දින අංක 2038/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ නියමයේ නිශ්චිතව දක්වා ඇති ගොඩබිම් සහ ජල ප්‍රදේශ සීමාවන්,

තුළ අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා හම්බන්තොට අධිකරණ කලාපය සම්බන්ධයෙන් කටයුතු කරන මහාධිකරණ විනිසුරුවරයා වෙත බලය පවරනු ලැබේ.

**ජනාධිපති නීතිඥ මොහොමඩ් අලි සබ්රි,**
අධිකරණ අමාත්‍ය.

2021 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 293

1A - G 34792 — 70 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*